## ඩී.එස්. සේනානායක විදුහල, කොළඹ 07.

**දෙවන වාර ඇගයීම - 2016 මාර්තු**
**12 ශ්‍රේණිය**
**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - 1**

*කාලය පැය 1*

**1 - 20 තෙක් ප්‍රශ්නවලට වඩාත්ම නිවැරදි පිළිතුර තෝරන්න.**

01. සන්නිවේදනය යන්නට දිය හැකි වඩාත් නිවැරදි අර්ථකථනය වන්නේ,
    - i. යමක් මැනවින් දැනුම්දීමේ ක්‍රියාවලියයි.
    - ii. අන්තර් මානව සබඳතා ගොඩ නංවාගැනීමේ ක්‍රියාවලියයි.
    - iii. පොදු බවට පත්කිරීමට බෙදා හදා ගැනීම යන අදහසයි.
    - iv. තොරතුරු හා අදහස් හුවමාරුවයි.
    - v. සංස්කෘතිය පවරාදීමේ කාර්යයි

02. හැරල්ඩ් ඩී ලැස්වෙල් ආකෘතිය මගින්,
    - i. ප්‍රතිපෝෂණය පිළිබඳ අවධානය යොමු කරයි.
    - ii. මාධ්‍ය හා නාලිකාව නොසලකා හරියි.
    - iii. ගණිතමය ලක්ෂණ පදනම් කර ගනියි.
    - iv. රේඛීය බව පෙන්නුම් කරයි.
    - iv. සන්නිවේදන බාධක මත පදනම් වෙයි.

03. 1976 දී ගලි හා ලෙදර්ස් විසින් පෙන්වාදුන් පරිදි කිසියම් සන්නිවේදන විධි ක්‍රමයකින් ඉටු කෙරෙන කාර්යයන් කිහිපයක් මෙසේය.
    - A - අන්තර් පුද්ගල සන්නිවේදනයේදී අර්ථය වටහා ගැනීමට උපකාරී වේ.
    - B - වාචිකව ඉදිරිපත් කරනවාට වඩා හොඳින් හැගීම් හා භාවයන් ඉදිරිපත් කළ හැකිය.
    - C - සංඥා හා ඉගි නිසා උසස් සන්නිවේදන මට්ටමක් ඇතිවේ.

    ඉහත කාර්යයන් ඉටුවන්නේ,
    - i. ලිඛිත සන්නිවේදනයෙනි
    - ii. දෘශ්‍ය සන්නිවේදනයෙනි
    - iii. ශ්‍රව්‍ය සන්නිවේදනයෙනි
    - iv. අවාචික සන්නිවේදනයෙනි
    - v. විධිමත් සන්නිවේදනයෙනි

04. කිසියම් සන්නිවේදන වර්ගයක ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
    - A - සංකීර්ණ සන්නිවේදන ක්‍රියාවලියකි.
    - B - බහුතර ග්‍රාහකයා වෙනුවෙන් සංදේශ නිකුත් කරයි.
    - C - දොරටු පාලකයින් ගණනාවක් ක්‍රියාත්මක වේ.
    - D - සන්නිවේදන බාධා බොහෝ විට අවමය.

    ඉහත ලක්ෂණ දැකිය හැකි වන්නේ,
    - i. සමූහ සන්නිවේදනයේය.
    - ii. අන්තර් පුද්ගල සන්නිවේදනයේය.
    - iii. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයේ ය.
    - iv. විධිමත් සන්නිවේදනයේ ය.
    - v. ජන සන්නිවේදනයේ ය.

05. පොදු ලාභ ප්‍රයෝජන අපේක්ෂාවෙන් තොරව නව සමාජ වෙනසක් ඇතිකිරීම වෙනුවෙන් ක්‍රියා කරන ජනමාධ්‍ය ශෛලියක් වන්නේ,
    - i. විකල්ප හා විරෝධ කල්ප මාධ්‍යයයි.
    - ii. පුරවැසි මාධ්‍යයේ යයි.
    - iii. මුද්‍රිත මාධ්‍යයයි
    - iv. ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍යයි
    - v. නව මාධ්‍යයයි

06. පුද්ගලයාට නිරන්තරයෙන් පරිසරය පිළිබඳව අවදියෙන් සිටින්නට අවකාශ ලැබෙන්නේ සන්නිවේදනයෙන් සිදුවන කුමන කාර්යය නිසාද ?
    - i. තොරතුරු සම්පාදන කාර්යය නිසාය.
    - ii. විනෝදාස්වාදය සැපයීමේ කාර්යය නිසාය.
    - iii. අධ්‍යාපනය ලබාදීමේ කාර්යය නිසාය.
    - iv. පෙළඹවීමේ කාර්යය නිසාය.
    - v. සමාජ සංවිධානමය කාර්යය නිසාය.

07. සමූහිකව කටයුතු කිරීමේදී එම සමූහය අතර තිබියයුතු නිපුණතාවන් දැක්වෙන පිළිතුරු කාණ්ඩය වන්නේ,

A- සමූහය හඳුනාගෙන සිටීමයි.
B- ඵලදායී කථනයයි.
C- විසම්මුතිය හා ඵකඟත්වයයි.
D- තාර්කික චින්තනයයි.
E- වගකීම හා වගවීමයි.

i. A,B,C ii. A,C,D iii. A,C,E iv. B,C,E v. B,D,E

08. සමාජ පන්ති හා බලය නිර්මාණය කරන ප්‍රධානතම සාධකය වන්නේ,

i. සන්නිවේදනයයි ii. දේශපාලනයයි iii. සමාජයේ උපරිම ව්‍යුහයයි
iv. සම්පත් හිමිකමයි v. මාධ්‍ය සංස්කෘතියයි

09. සන්නිවේදන ක්‍රියාවලියට උපකරණ යොදාගැනීමට සිදුවන්නේ,

A - මිනිසා සතු සන්නිවේදන ශක්තියේ සීමාව ඉක්මවා යන විටදීය.
B - සන්නිවේදන කාර්යය වඩාත් පහසු කරගැනීමයි.
C - සන්නිවේදන ක්‍රියාවලිය වඩාත් විධිමත් හා කාර්යක්ෂම කරගැනීමටය.

ඉහත ප්‍රකාශ අතුරින් සත්‍ය වන්නේ,

i. A පමණි ii. B හා C පමණි iii. A,B,C යන සියල්ලමය iv. C පමණි v. A හා C පමණි

10. මතකයේ ස්වභාවය දැක්වෙන ප්‍රතිශතාත්මක ගණන් අතුරින් පුද්ගලයෙකු ඇසූ දුටු දෙයින් මතකයේ රැදෙන ප්‍රතිශතය

i. 10% ii. 30% iii. 50% iv. 70% v. 20%

11. ස්ව-සංකල්පය සම්බන්ධයෙන් ඉදිරිපත්ව ඇති සදොස් ප්‍රකාශය මින් කුමක්ද ?

i. ස්ව-සංකල්පය උපතින් පිහිටන දෙයක් නොවේ
ii. ස්ව- සංකල්ප පුද්ගලයාව තමා තේරුම් ගැනීමට ඉවහල් වේ.
iii. ස්ව-සංකල්පය සන්නිවේදනය සමඟ බැඳී ඇත.
iv. ස්ව- සංකල්පය ඇගයීමට ලක්කළ හැකිය.
v. ස්ව-සංකල්පය පෝෂණය කළ නොහැකිය.

12. ගෝලියකරණයේ නව ප්‍රවනතා කිහිපයක් පහත දැක්වේ.

A - ජාතික රාජ්‍යයක් දුර්වල වීම.
B - ද්‍රව්‍යමය ආර්ථිකය අභිබව මූල්‍ය ආර්ථිකය ශක්තිමත් වීම.
C - ගෝලිය තොරතුරු අවකාශයක් නිර්මාණය වීම
D - ජන සන්නිවේදනයේ සීමිත වර්ධනයක් සිදුවීම.

ඉහත ප්‍රකාශ අතුරින් සත්‍ය වන්නේ,

i. A, B පමණි ii. B,C හා D පමණි iii. A,C,D පමණි
iv. A,B,D පමණි v. A,B හා C පමණි

13. සමාධි ඉතා කාරුණික තැනැත්තියකි. ඇය නිතරම අන් අයට උදවු උපකාර කරයි. අන් අයගේ දුකේදී සැපේදී එය තමන්ගේම දෙයක් ලෙස සලකා කටයුතු කරයි. මෙම ලක්ෂණ අනුව සමාධි ගැන කිය හැකි වන්නේ,

i. ඇය ඉතා හොඳ බෞද්ධ තරුණියක් බවය
ii. ඇය මානව ධර්මතා වලින් පිරි යුවතියක් බවය.
iii. ඇය කළණ මිතුරියක් බවය.
iv. ඇය ආචාරශීලි බවින් යුතු බවය.
v. ඇය සහානුභූතියෙන් යුතු බවය.

14. භාෂාවේ පරිණාමය පිළිබඳ වඩාත් නිවැරදි අදහස වන්නේ,

i. පළමුව හෝඩිය බිහිවී, දෙවනුව භාෂාවද, තෙවනුව අකුරු ද බිහිවූ බවය.
ii. පළමුව භාෂාවද, දෙවනුව අක්ෂරද, තෙවනුව හෝඩියද නිර්මාණය වූ බවය.
iii. පළමුව අකුරු ද, දෙවනුව හෝඩියද, තෙවනුව භාෂාවද බිහිවූ බවය.
iv. භාෂාවත්, හෝඩියත්, අක්ෂරත් එකවර බිහිවූ බවය.
v. පළමුව හෝඩිය බිහිවී, දෙවනුව අක්ෂරද, තෙවනුව භාෂාවද බිහිවූ බවය.

15. කිසියම් භාෂාවක ලක්ෂණ කිහිපයක් මෙසේය.
A - සන්නිවේදන කාර්යය සඳහා යොදා ගනිමින් පවත්නා භාෂාවකි.
B - සංවේදී හා නිර්මාණශීලි ලෙස අදහස් ප්‍රකාශ කිරීමට භාවිතා කෙරේ.
C - වෙනස්වීමට ලක්වේ.
ඉහත ලක්ෂණ දැකිය හැක්කේ
i. සිංහල භාෂාවේය. ii. ඉංග්‍රීසි භාෂාවේය. iii. ජීව භාෂාවකය
iv. සම්මත භාෂාවකය v. සාම්ප්‍රදායික මාධ්‍ය තුළය

16. උප භාෂාවන් සම්බන්ධයෙන් ඉදිරිපත් ව ඇති සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
i. ප්‍රධාන භාෂා ධාරාවෙන් බිඳී ආ අනුධාරාවකි.
ii. උපභාෂා බිහිවීම මානව සමාජයේ අවශ්‍යතාවයකි.
iii. උප භාෂාවන් බිහිවීම ස්වභාවික සංසිද්ධියකි.
iv. උප භාෂාවකින් අදාළ සංස්කෘතිය නිරූපනය වේ.
v. උපභාෂාවන් බිහිවීම ජන මාධ්‍යයන්ට පහසුවකි.

17. කෙටිකාලීන මතකයන් දිගුකාලීන මතකයක් බවට පත්වීම සඳහා යෙදිය හැකි උපක්‍රමයක් නොවන්නේ,
i. අභ්‍යාසය ii. භාවිතය iii. ආවර්ජනය
iv. ආභාෂය v. අවධාරණය

18. සුනිමල් පාසලේ කලා සංගමයේ සභාපති වේ. ඔහු ඕනෑම කටයුත්තකදී තමාට පැවරුනු වැඩ කොටස ගැන පමණක් නොව නොපැවරුනු වැඩ කොටස් පිළිබඳව ද සොයා බලා කටයුතු කරයි. ඒ අනුව සුනිමල්,
i. සමූහයේ පැවැත්මට අත්‍යවශ්‍ය වේ.
ii. ක්‍රියාකාරී සාමාජිකයෙකි.
iii. සමාජයේ පෙර ගමන් කරුවෙකි.
iv. වගකීම හා වගවීම හඳුනාගෙන ක්‍රියා කරන්නෙකි.
v. තම වගකීම් නිසි ලෙස ඉටු කරන්නෙකි.

19. මිනිසා සිය දෛනික කටයුතු සඳහා භාවිත කරන්නේ,
i. ප්‍රාදේශීය භාෂාවකි ii. මානව භාෂාවකි iii. ජීව භාෂාවකි
iv. උප භාෂාවකි v. ජාතික භාෂාවකි

20. කමත් භාෂාව,
i. ප්‍රාදේශීය උපභාෂාවකි ii. සාමාජීය උපභාෂාවකි iii. වෘත්තික උපභාෂාවකි
iv. පාරිසරික උපභාෂාවකි v. ඉහත කිසිවක් නොවේ

# ඩී.එස්. සේනානායක විද්‍යාලය, කොළඹ 07.

දෙවන වාර ඇගයීම - 2016 මාර්තු
12 ශ්‍රේණිය
සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II

කාලය පැය 2

**ප්‍රශ්න 3 කට පමණක් පිළිතුරු සපයන්න.**

01. විදුර හා කවිඳු මුහුණු පොත (face book) හරහා පසුගිය අධ්‍යාපන චාරිකාවේදී ගත් ඡායාරූප හුවමාරු කරගනිමින් ඒ පිළිබඳ සංවාදයේ යෙදෙමින් සිටිති( chatting)

i. ඉහත අවස්ථාව හඳුන්වනු ලබන සන්නිවේදන වර්ගය කුමක්ද ? (ල.02)

ii. එහි ලක්ෂණ 2 ක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ල.04)

iii. ඉහත අවස්ථාවට අදාළ නොවන සන්නිවේදන වර්ග 2 ක් නම් කර එහි ලක්ෂණ දෙක බැගින් ලියන්න. (ල.06)

iv. සන්නිවේදන ස්වරූප 2 ක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ල.08)

02. i. පුරවැසි මාධ්‍යවේදයේ ලක්ෂණ 4 ක් නම් කරන්න. (ල.02)

ii. ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවේ ජන සන්නිවේදන ක්ෂේත්‍රය තුළ සිදුවී ඇති වෙනස්කම් 2 ක් විස්තර කරන්න. (ල.04)

iii. විකල්ප හා විරෝධාකල්ප මාධ්‍ය ලක්ෂණ 3 ක් විස්තර කරන්න. (ල.06)

iv. ඵලදායි කථනයක යෙදීමට නම් කථකයා විසින් සැලකිලිමත් විය යුතු කරුණු 4 ක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ල.08)

03. i. ශ්‍රවනයේ අවස්ථා 4 නම් කරන්න. (ල.02)

ii. සමූහ සන්නිවේදන නිපුනතාවක් ලෙස සම්මුඛ සාකච්ඡා පැවැත්වීමෙන් එකී සමූහයට අත්වන වාසි 2 ක් විස්තර කරන්න. (ල.04)

iii. ප්‍රක්ෂේපණිය සන්නිවේදන උපකරණයක් ලෙස බහු මාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍රය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට දායක කරගත හැකි ආකාර 3 ක් විස්තර කරන්න. (ල.06)

iv. සන්නිවේදන කාර්යයන් හෙවත් අරමුණු 2 ක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ල.08)

04. i. භාෂා උපාර්ජනය යනු කුමක්ද ? (ල.02)

ii. උප භාෂාවක ලක්ෂණ 2 ක් කෙටියෙන් විස්තර කරන්න. (ල.04)

iii. භාෂාවේ භාවිත ප්‍රභේද 4 ක් නම් කර, ඉන් 2 ක් විස්තර කරන්න. (ල.06)

iv. ප්‍රශස්ත ලේඛනයක ලක්ෂණ 4 ක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ල.08)